# ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය තුළින් ආර්ථිකයට ඇති කරන බලපෑම

ආර්.පී. ශානිකා රසාංජලි[1]

## සංක්ෂේපය

පසුගිය අවුරුදු 50 ක පමණ කාලය තුළ ම දියුණු වෙමින් පවත්නා බොහෝ රටවල් සංචාරක ව්‍යාපාරය සලකනු ලබන්නේ එම රටවල සියලු ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට සොයා ගන්නා ලද සර්ව රෝග නාශකයක් ලෙසයි. මෙම රටවල් ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය මෙසේ පහසු ආර්ථික සංවර්ධන උපක්‍රමයක් ලෙස සැලකීමට හේතුව එය මෙම රටවලට අත්‍යවශ්‍ය විදේශ විනිමය උපයන, රැකියා හා ආදායම් උත්පාදනය කර දෙන්නක් ලෙසයි. මේ නිසා බොහෝ සංවර්ධනය වෙමින් පවත්නා රටවල රාජ්‍යයන් සංචාරක කටයුතු පදනම් කරගත් සංවර්ධනය ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිවලට ඇතුළත් කර ඇත. එසේ වුවත් මෙම රටවල් සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිලාභ භුක්ති විඳින අතර ම ආර්ථික, සමාජ හා සංස්කෘතික හා පරිසරාත්මක වශයෙන් අහිතකර බලපෑම් අත්විඳිමින් සිටියි. මේ හැර ජාත්‍යන්තර දේශපාලන ආර්ථික ව්‍යුහයේ ස්වභාවය මඟින් පැනවෙන සම්බාධකවලට අනිවාර්යෙන් ම මුහුණ දීමට ඇති බැවින් ද විටින් විට ඇතිවන දේශපාලන අස්ථාවරභාවයන් නිසා ද බලාපොරොත්තු වන පරිදි සංචාරක ව්‍යාපාරයේ මහා ඵල භුක්ති විඳීමට ඇති හැකියාව සීමිත වී ඇත.

මේ ලිපියෙහි අරමුණ වන්නේ සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට කෙතරම් දායකත්වයක් සපයා ඇත් ද යන්න විමසීමයි. මෙහිදී සංචාරක ව්‍යාපාරය මෙරට විදේශ විනිමය කෙරෙහි බලපාන ආකාරය ද්විතියික දත්ත ආශ්‍රයෙන් මෑත වර්ෂ කිහිපයක සංඛ්‍යා දත්ත භාවිතයෙන් විශ්ලේෂණය කොට ඇත. මේ තුළින් පෙනී යන කරුණක් වන්නේ සංචාරක ව්‍යාපාරය විදේශ විනිමය ඉපයීම් අතින් ශ්‍රී ලංකාවේ සිව්වන ස්ථානයේ පසු වන බවයි. එසේම පසුගිය දත්තවලට අනුව සංචාරක ව්‍යාපාරය හේතුවෙන් විදේශ විනිමය වර්ධනය වී ඇති බව සඳහන් කළ හැකිය.

**මුඛ්‍ය පද:** *ශ්‍රී ලංකාව, සංචාරක, විදේශ විනිමය, සංවර්ධනය*

[1] සමාජ සංඛ්‍යානය (විශේෂ) තෙවන වසර , Shanika2rasa@gmail.com

## හැඳින්වීම

ලොව දැවැන්තම ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන සංචාරක ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් අප්‍රිකාව, ඇමරිකාව, ආසියාව, පැසිපික් සහ මැදපෙරදිග යන කලාප 05 ක් යටතේ සංචාරකයින් පැමිණීම සිදු වේ. වර්තමානය වන විට ජාත්‍යන්තර සංචාරකයින්ගේ සංඛ්‍යාව මිලියන 913 ක් පමණ වේ. මෙය සාමාජීය, දේශපාලන හා ආර්ථික වශයෙන් ගෝලීය ඒකාබද්ධතාවයක් පෙන්නුම් කරන ප්‍රබල සාධකයකි. 0(කුමාරි,2012 5 වන කලාපය)

සංචාරක ව්‍යාපාරය අහිතකර ලෙස යොදා ගැනීම නිසා සමාජීය, ආර්ථික, පාරිසරික හා සංස්කෘතික වශයෙන් අයහපත් බලපෑම් ඇති වුවත් එමඟින් ආර්ථිකයට ඇතිවන දායකත්වය සුළුපටු නොවේ. එසේම ආර්ථික වර්ධනය සඳහා විදේශ විනිමය, සේවා නියුක්තිය, ප්‍රාදේශීය සංවර්ධනය, රජයේ ආදායම් වැඩි වීම සහ ආර්ථික උත්තේජනය ඇතිවීම ආදිය මඟින් දායකත්වය සපයනු ඇත. මේ අනුව මධ්‍යම ආදායම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විදේශ විනිමය ඉපයීම් 2.6% ක් වැනි ඉහළ අගයක් ලබා ඇත. එසේම මෙමඟින් විරැකියාවෙන් පෙළෙන තරුණ පිරිසට සෘජු හා වක්‍ර රැකියා ජනිත කිරිම, නාගරික සංවර්ධනය ග්‍රාමීය ප්‍රදේශ කරා ව්‍යාප්ත වීම සහ ආර්ථික උත්තේජනය ඇති වීම යනාදිය මඟින් ආර්ථිකය වර්ධනය වී ඇත. මෙම තත්ත්වය සංවර්ධිත ඉලක්ක කරා ගමන් කරන මැදි ආදායම් රටක් වන ශ්‍රී ලංකා ආර්ථිකයට වඩා වැදගත් වේ (කුමාරි, 2012 5 වන කලාපය). ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක සංචාරක ව්‍යාපාරය අද බලවත් වාණිජ ව්‍යාපාරයක් බවට පත් වී ඇත්තේ, සංචාරක ව්‍යාපාරය සේවාවක් වීමත්, ස්වභාව සෞන්දර්ය හා අලංකාරය යන කරුණු මූලික වශයෙන් උපයෝගී වන, අධික අමුද්‍රව්‍ය යොදා ගැනීමකින් තොරව පවත්වාගෙන යන කර්මාන්තයක් වීමත් නිසා ය. සුළු ආයාසයකින් වැඩි ප්‍රයෝජනයක් ලබා දෙන කර්මාන්තයක් බැවින් ශ්‍රී ලංකාව මේ කෙරේ වැඩි අවධානයක් යොමු කර ඇත.

සංචාරක ව්‍යාපාරය ලෝකයේ සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික වෘද්ධියේ වැදගත් අංශයක් බවට පත් වී ඇත. මෙමඟින් ආර්ථික සංවර්ධනයට අවශ්‍ය විදේශ දායකත්වය සපයනු ලබයි. සංචාරක කර්මාන්තය යනු ආර්ථික වර්ධනය සහ සේවා නියුක්ති අවස්ථා සපයන මූලයක් ලෙස සංවර්ධනය වෙමින් පවතින රටවල හඳුන්වනු ලබයි. සංචාරක කර්මාන්තය පිළිබඳව නිර්වචනය කිරීමේදී විවිධ චින්තක අදහස් ද බෙහෙවින් වැදගත් වේ. මැතිසන් සහ වෝල් විස්තර කරන පරිදි සංචාරක කර්මාන්තය යනු තම එදිනෙදා වැඩ කරන හා නවාතැන් ස්ථානයන්ගෙන් බැහැර ප්‍රදේශ වෙත පුද්ගලයන් චලනය වීමත්, සංක්‍රමණික ප්‍රදේශ වල ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ ඔවුන්ගේ

අවශ්‍යතාවයන් තෘප්ත කර ලීමට ඇතිකරන ලද පහසුකම්ය (Mathieson and Wall, 1982). ලෝක සංචාරක සංවිධානය විසින් සංචාරක ව්‍යාපාරය පහත අකාරයට නිර්වචනය කර ඇත. එනම්,

"විවේකය, ව්‍යාපාර සහ පැමිණි ස්ථානයේ ගාස්තුවක් ගෙවන කාර්යයේ යෙදීමට අදාළ නොවන වෙනත් අරමුණු උදෙසා පැය 24 කට වඩා වැඩි සහ අනුගාමී එක් වසරකට වැඩි නොවන කාලයක් උදෙසා ඔවුන්ගේ පුරුදු වටපිටාවෙන් පරිභාහිර ස්ථානයකට චාරිකා කිරීම සහ එම ස්ථානයන්හි නැවතී සිටීම" ලෙස දක්වා ඇත (කුමාරි, 2012 5වන කලාපය).

ඉහත කරුණුවලින් සංචාරකයා හා සංචාරණය යනු කුමක්ද යන්න පිළිබඳ ව දැන ගැනීමට හැකි වේ. කෙසේ වෙතත් සංචාරණය සිදුකරනු ලබන පුද්ගලයාගේ ස්වභාවය අනුව අපට සංචරණය ප්‍රධාන වශයෙන් කොටස් 2කට වර්ග කළ හැකි වේ.

1. දේශීය සංචාරණය
2. ජාත්‍යන්තර සංචාරණය

කිසියම් රටක පුරවැසියන් ඔවුන් ජීවත් වන එම රට තුළ සිදුකරනු ලබන සංචරණයන් ඉතා සරල ව දේශීය සංචරණය ලෙස හඳුන්වා දිය හැකි වේ. කෙසේ වෙතත් ලෝක සංචාරක සංවිධානය, ජාතික සංචාරක සංවිධානවලට දේශීය සංචාරකයින් පිළිබඳ ව නිර්වචන ඉදිරිපත්කර ඇත. ඒ අනුව "රැකියාවක් සඳහා නොවන, තමන්ගේ රට තුළ සංචාරණය කරන පුරවැසියන් දේශීය සංචාරකයින් ගණයට ඇතුළත් කළ යුතුය"ග (ගුණවර්ධන හා සල්ඩීන්, 2008). මෙම නිර්වචනයට අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියන් රැකියාවක් මූලික නොකරගෙන කිසියම් ස්ථානයකට සංචාරණය කරයි නම් එය ශ්‍රී ලංකාවේ දේශීය සංචරණය වන අතර, එසේ සංචාරණය කරන පුරවැසියන් දේශීය සංචාරකයින් ලෙස පෙන්වා දිය හැකිය. ලෝකයේ සෑම රටක් තුළම වැඩිපුර ම ක්‍රියාත්මක වන්නේ දේශීය සංචරණය යි. ආගමික ස්ථාන හා ස්වභාවික සෞන්දර්ය ස්ථාන වැනි ස්ථාන මෙහි දී වැදගත් වේ. ශ්‍රී ලංකාව ගැන අවධානය යොමු කිරීමේ දී ඈත අතීතයේ සිට ම ශ්‍රී ලාංකිකයන් ලංකාවේ විවිධ ස්ථානවල (අනුරාධපුරය, කතරගම, මහියංගනය, සීගිරිය) සංචරණය කර ඇත. එහි දී ඔවුන් වැඩිපුර සංචරණය සිදු කළේ ආගමික ස්ථාන මූලික කරගෙන ය. වර්තමානය වනවිට දේශීය සංචරණය ආගමික ස්ථාන (අනුරාධපුර, කැලණිය, ශ්‍රී පාදය), ස්වභාවික සෞන්දර්ය ස්ථාන (ගල්කිස්ස, සිංහරාජ, දුන්හිඳ දිය ඇල්ල, හෝර්ටන් තැන්න), අධ්‍යාපනය (කෞතුකාගාර, කලාගාර), විනෝදය (මීගමුව වෙරළ, නුවර එළිය, හික්කඩුව) යන අරමුණු මූලික කරගෙන දේශීය සංචරණය සිදුවේ.

සංචාරණය වර්ග කිරීමේ අනෙක් අංගය වන්නේ ජාත්‍යන්තර සංචරණය යි. කිසියම් රටක පුද්ගලයෙකු වෙනත් රටක සංචාරණය සිදු කරයි නම්, එය ජාත්‍යන්තර සංචරණය වශයෙන් පෙන්වා දිය හැක. උදාහරණ වශයෙන් බ්‍රිතාන්‍ය රටේ පුරවැසියකු ඉන්දියාව තුළ සංචාරණය කරයි නම්, එය ජාත්‍යන්තර සංචරණය වන අතර එසේ ඉන්දියාවේ සංචරණය කරන පුද්ගලයා ජාත්‍යන්තර සංචාරකයෙකු වශයෙන් හඳුන්වයි. ලෝක සංචාරක සංවිධානයට අනුව ජාත්‍යන්තර සංචාරකයෙකු නිර්වචනය කරන්නේ " සාමාන්‍යයෙන් පැය 24කට වඩා වැඩි කාලයක් ගෙවමින් වෙනත් රටක සංචාරය කරන තැනැත්තෙකි." (ගුණවර්ධන හා සල්ඩීන්, 2008). මෙහිදී අදාළ රටේ අධ්‍යාපනය ලැබීමට යන පාසල් සිසුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, රැකියාවන් සඳහා යන පිරිස්, රාජ්‍ය තාන්ත්‍රික නිළධාරීන් සහ හමුදා නිළධාරීන්, විදේශීය සංචාරකයින් ද යන ගැටලුව ඇති විය. මේ නිසා නිල සංචාරක සංවිධාන වල ජාත්‍යන්තර සංගමය මඟින් අධ්‍යාපනය ලැබීම මූලික කර ගෙන පැමිණෙන අය සංචාරකයින් ලෙස වර්ග කර තිබෙන අතර පැය 24 ට වඩා අඩුවෙන් යම් කිසි රටක සංචාරණය කරන නාවිකයන් හා ගුවන් සේවකයන් තාවකාලික අමුත්තන් වශයෙන් පෙන්වා දී තිබේ.

## සංචාරක ව්‍යාපාරය වර්ධනය වීමට හේතු

1950 න් පසු සංචාරක ව්‍යාපාරයේ දියුණුවීම වේගවත් විය. සුන්දර ස්ථාන, නව ඉදිකිරීම් නැරැඹීම හා විවේක සුවයෙන් ගත කිරීමේ අභිප්‍රාය එකල ද දක්නට ලැබුණි. සංචාරකයන් හට නවාතැන් ගැනීම සඳහා නව නිකේතන බිහිවීමෙන් ආදායමක් උපයා ගැනීම ඒ තුළින් ලැබුණු එක් ප්‍රතිලාභයක් වශයෙන් දැක්විය හැකිය. උතුරු අප්‍රිකාව හා දකුණු යුරෝපයට සම්බන්ධ ස්ථානයන්හි නිකේතන බිහිවීමෙන් එහි ලාභය ඔවුන් වෙතම රැඳුනු නිසා සංචාරක ව්‍යාපාරය යුරෝපීය ජාතීන්ගේ ඒකාධිකාරය බවට පත් විය.

ඇමරිකා එක්සත් ජනපදය, ෆ්ලොරිඩාව, කැලිෆෝනියාව, මෙක්සිකෝව, කැරිබියන් දූපත්, උරුගුවේ, බටහිර අයිවරි කෝස්ට් හා ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල සංචාරක නිකේතන බිහිවූයේ, සංචාරය සඳහා විදේශිකයන් පැමිණීම නිසා ය. මෙයින් ලැබූ ආදායම නිසා සංචාරක නිකේතන සංවර්ධනය කෙරෙහි රාජ්‍ය අවධානය ද යොමු විය.

බොහොමයක් රටවල සංචාරක කර්මාන්තය සඳහා වෙරළබඩ ප්‍රදේශ තෝරාගැනීමට හේතු වූයේ, දවසේ වැඩි කාලයක් සූර්යාලෝකය, උණුසුම් හා නිශ්චල මුහුදු වෙරළ හා පුළුල් වැලිතලා නිසා ය. ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නගරයේ දකුණු දිග සැතපුම් 25 ක දුර ප්‍රදේශයක් සංචාරක මුහුදු ක්‍රීඩා ප්‍රදේශයක් වශයෙන් නම් කර ඇති දැනට සංචාරක හෝටල් 3000 කට වඩා වැඩි ප්‍රමාණයක් එහි පිහිටුවා ඇත (කුමාර, 2009).

සංචාරක කර්මාන්තයේ දී ගමනාගමන පහසුකම් එහි දියුණුවට මහත් පිටුවහලක් විය. මේ කාලය වන විට ගුවන් පහසුකම් පැවතිම සංචාරක කර්මාන්තයේ පුළුල් වර්ධනයට බෙහෙවින් උපකාරි විය. නිදසුනක් ලෙස, 1830 දී "ලිවර්පුල්" හා "මැන්චෙස්ටර්" අතර දුම්රිය සේවා ආරම්භ වීමත්, ඉක්බිති කෙටි ලන්ඩනය හා සෙසු නගර ද දුම්රිය මාර්ග මගින් සම්බන්ධ වීමක් දැක්විය හැකිය. 1881 වන විට දශලක්ෂ 623 ක මගීන් සංඛ්‍යාවක් දුම්රියෙන් ගමන් කර තිබුණි. දුම්රිය සේවාව ව්‍යාප්ත විමත් සමග නැව් ගමනාගමනය පුළුල් විමක් ද දක්නට ඇත. නැව් මගින් දීර්ඝ ගමන් සංවිධානය කරන වෙළඳ ආයතන ද පිහිටුවා ගන්නා ලදි. එම මගීන් ම අතිරේක මුදල් අයකර නවාතැන් පහසුකම් සැලසීම ද මෙම ආයතන මඟින් ඉටුකරන ලදි. ඒ සඳහා හෝටල් තෝරා ගැනිම නිසා ඒවායේ අවශ්‍යතාවය වැඩි විය. ජනතාව ඊට හොද ප්‍රතිචාර දැක්විමත් සංචාරක ගමන් සංවිධානය කරන පිරිසක් බිහිවිමත් නිසා සංචාරක කර්මාන්තයක් හෙවත් ආදායම් උපදවන මාධ්‍යයක් වශයෙන් වර්ධනය වන්නට විය (කුමාර, 2009).

යම් රටක පිහිටිමේ ස්වභාවය සංචාරක කර්මාන්තයේ දියුණුවීමට බෙහෙවින් බලපා ඇත. යුගොස්ලාවියාවේ ඩැල්මේෂන් වෙරළ තීරුව සහ එහි දේශගුණය නිසා ද සංචාරක කර්මාන්තය දියුණුව කරා ළගා වීම දැක්විය හැකිය. එමෙන් ම ඇමරිකාවේ ගල් පර්වත සහිත කඳුකර ප්‍රදේශය, ස්විස්ටර්ලන්තයේ අභ්‍යන්තර මුහුද, බ්‍රිතාන්‍යයේ විල් සහිත දිස්ත්‍රික්කය මැණික් ප්‍රදේශ ද හඳුන්වා දිය හැකිය.

## ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ආරම්භය සහ එහි වර්ධනය

1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව බොහෝ විදේශීය සංචාරකයින් පිරිසක් ලංකාවට පැමිණීම නිසා රජයේ සංචාරක කාර්යාංශයේ කාර්යාලයක් කොළඹ වරායේ ජැටියේ නිර්මාණය කරන ලදී. මීට අමතරව සංචාරකයින්ට සේවා සැපයීමට බලපත්‍ර සහිත සංචාරක මාර්ගෝපදේශක සේවාවක් හා ජැටිය තුළ කුලී රථ සේවාවක්ද 1953 වසරේදි පිහිටුවන ලදී. 1960 දශකය තුළ අපනයන බෝග වන තේ, පොල්, රබර්වල ජාත්‍යන්තර වෙළඳපොළ තුළ අඩු මිළක් ලැබීම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට සංචාරක කර්මාන්තය සම්බන්ධ කරගත යුතු බොහෝ නායකයන්ගේ මතය විය. මේ නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නගා සිටුවීම වෙනුවෙන් තබන ලද යෝධ පියවරක් ලෙස 1966 අංක 10 දරණ සංචාරක මණ්ඩල නිර්මාණය විය. මෙම පනත මගින් 1966 මැයි 1 වන දින ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීය. මෙම මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථ 2ක් තිබුණි. එනම්,

(අ) සංචාරක චාරිකා සඳහා අනුබල දීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම.

(ආ) ප්‍රමාණවත්, කාර්යක්ෂම හා ආකර්ෂණීය සංචාරක පහසුකම් සඳහා අනුබල දීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම.

ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමෙන් පසුව 1966 අංක 14 දරන පාර්ලිමේන්තු පනත මඟින් ලංකා හෝටල් සංස්ථාවද පිහිටුවන ලදී. මෙම පනත් 2 නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පරිවර්තනයේ වෙනසක් සිදුවිය. විදේශීය සංචාරකයින් රට තුළට ආකර්ෂණය කරගැනීම සඳහා නොයෙක් සැළසුම් මෙම වකවානුව තුළ නිර්මාණය කළ අතර එහි පළමු සැලැස්ම ලෙස Harris Kerr Foster ආයතනය 1967-1977 කාලය ආවරණය වන සේ දස අවුරුදු සැළැස්ම නිර්මාණය කරන ලදී. මෙම මහා සැලැස්ම යටතේ ශ්‍රී ලංකාවේ තිබෙන සියලුම ආකර්ෂණ සංවර්ධන කලාප 5ක් යටතේ සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. මින් පසුව 1977-1982 දක්වා කාල වකවානුව තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම සඳහා පස් අවුරුදු සැළැස්ම ඉදිරිපත් කරන ලදී. ගලදාරි, හිල්ටන්, තාජ් සමුද්‍රා වැනි හෝටල් නිර්මාණය වන්නේ මෙම සැළැස්ම යටතේය. මෙම කාලයේ දී සංචාරකයන් විශාල වශයෙන් විදේශිකයන් ලංකාවට පැමිණ තිබේ. එය 1982 වසරේ 407,230 ක විදේශීය සංචාරක පිරිසක් පැමිණීම මඟින් සනාථ කරගත හැකි වේ.

මේ ආකාරයට ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව සිදු වූ වර්ධනය, රට තුළ නිර්මාණය වූ ජාතිවාදී අරගල යුධ තත්වයන් හමුවේ අඩාල විය. එහි පළමු අවස්ථාව ලෙස 1983 ජූලි මාසයේ ඇති වූ කළු ජූලිය හඳුන්වා දිය හැකිය. මේ නිසා 1982 දී වර්ෂයේ දී 407,203 දක්වා වර්ධනය වී තිබූ සංචාරක පැමිණීම, 1984 දී 257,458ක් දක්වා අවපාතයකයට යොමුවිණි (පතිරණ 2010).

මේ ආකාරයට අවපාතයකට ලක් වූ සංචාරක කර්මාන්තය ඉන් පසුව ඇති වූ නොයෙක් සිදුවීම් හමුවේ තවත් අවපාතයකට ලක් විය. එහි පළමු අවස්ථාව කළු ජූලියෙන් පසුව උතුරු- නැගෙනහිර රජයේ හමුදාව හා L.T.T.E ත්‍රස්තවාදීන් අතර ඇති වූ යුද්ධය යි. මීට අමතරව 1988 හා 1989 වසරවල් තුළ දකුණේ ජේ. වී. පී. මූලික කරගෙන ඇති වූ තරුණ කැරලි හමුවේ සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය වීම, තරුණියන් 6000ක් ඝාතනයට ලකවීම වැනි හේතුන් නිසා ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව මිණී කන්නන්ගේ දේශය බවට පත්වීම හරහා විදේශීය සංචාරකයන් ශ්‍රී ලංකාවට සංචාරක ගමනාන්තයක් වශයෙන් තෝරා ගත්තේ නැත.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට කන කොකා හැඬූ මේ අවධියෙන් පසුව රටේ 1990 දශකය තුළ වර්ධනය කිරීමට නොයෙක් ක්‍රියා මාර්ග ගන්නා ලදී. ඒ අනුව නැවත සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා 1991-2001 දස අවුරුදු සැළැස්ම නිර්මාණය කරන ලදී. මෙම සැළැස්ම යටතේ ශ්‍රී ලංකාවට සංචාරකයන් උත්පාදනය කරන ප්‍රධාන රටවල් වූ

ජර්මනිය, උතුරු ඇමෙරිකාව, ප්‍රංශය වැනි රටවල් මූලික කරගෙන සංචාරක ප්‍රවර්ධන කටයුතු කරන ලදී. මේ තත්වය නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ධනය වීමට පටන් ගන්නා ලදී. ඒ බව 1999 දී 407,511, 1995 දී 403,511 වශයෙන් සංචාරකයන් පැමිණීම වර්ධනය වීම තුළින් හඳුනාගත හැකි අතර මෙසේ ඇති වූ වර්ධනය 1996 කොළඹ මහා බැංකු ගොඩනැගිල්ලට L.T.T.E ත්‍රස්තවාදීන් සිදුකළ ප්‍රහාරය නිසා පහත වැටුණි. එය තවත් අවපාතයට ලක්වූයේ ශ්‍රී ලංකාවට සංචාරකයන් මුලින්ම පැමිණෙන කටුනායක ගුවන් තොටුපලට 2001 ජූලි 24 වැනිදා L.T.T.E විසින් එල්ල කළ ප්‍රහාරය නිසාය. මෙම තත්ත්වය නිසා ශ්‍රී ලංකාවට විදේශීය රටවලින් සංචාරකයින් ඒමට බියක් දක්වන ලදී. මීට අමතරව එම 2001 වසරේ සැප්තැම්බර් 11 වැනිදා අල්කයිඩා ත්‍රස්තවාදීන් ඇමෙරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල කළ ප්‍රහාරය ශ්‍රී ලංකාවට පමණක් නොව ලෝකයේ සෑම රටකම සංචාරක කර්මාන්තයට දැඩි ප්‍රහාරයක් විය.

2002 වසරේදී ශ්‍රී ලංකාවේ පැවැත්වූ මැතිවරණයෙන් බලයට පත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් L.T.T.E සංවිධානය සමග ඇති කරගත් සාම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස රට තුළ ඇති වූ සාමකාමී පරිසරය නිසා නැවතත් විදේශීය සංචාරකයින් රට තුළට පැමිණීමට පටන් ගැණිනි. මීට අමතරව දේශීය සංචාරකයන් ද රටේ සෑම තැනකම සංචාරණය කිරීමට යොමුවිය. ඇති වූ මේ සාමකාමී තත්වය නිසා ලංකාවේ සංචාරක කර්මාන්තය විධිමත්ව ආරම්භ වූ දා සිට රටට පැමිණි වැඩිම සංචාරක ප්‍රමාණය වාර්තා වන්නේ 2004 දීය. එය සංඛ්‍යාත්මකව 566,202ක් විය. මේ ආකාරයට වර්ධනය වූ සංචාරක කර්මාන්තය 2004 දෙසැම්බර් 26 දින ලංකාවට බලපෑ සුනාමිය නිසා දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් මරණයට පත්විය. මෙසේ ඇති වූ අයහපත් පාරිසරික තත්වය නිසා නැවතත් සංචාරක කර්මාන්තය අඩාල විය.

2006 වසරේ බලයට පත් එක්සත් ජනතා නිදහස් සන්ධානය ප්‍රමුඛ රජය L.T.T.E සංවිධානය සමග සාම සාකච්ඡා ඇති කරගැනීමට උත්සාහ කළ ද එම සාකච්ඡා අසාර්ථක වීම නිසා L.T.T.E සංවිධානය හා ශ්‍රී ලංකා රජයේ හමුදාව අතර ඇති වූ යුධමය තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට දැඩි බලපෑම් එල්ල විය. නමුත් මෙම යුධමය තත්ත්වය 2009 මැයි 26 වන දින L.T.T.E ත්‍රස්තවාදී සංවිධානය යුධමය වශයෙන් පරාජය කිරීමට රජයේ හමුදාවන්ට හැකිවිය. යුද්ධය අවසන් වීමෙන් පසුව රටේ සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම සඳහා නොයෙක් ක්‍රියාමාර්ග ශා සැලසුම් මේ වනවිට සංවිධානය කරමින් තිබේ. මේ අනුව රට තුළ තෝරාගත් සංචාරක කලාප සංවර්ධනය කිරීම, අළුතින් සංචාරක කලාප නිර්මාණය කිරීම(කල්පිටිය), යටිතල පහසුකම් වර්ධනය කිරීම(කොළඹ කටුනායක අධිවේගී මාර්ගය, දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය,). මෙසේ ඇතිකරන සංචාරක ඇතිකරන සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමේ

ව්‍යාපෘති හමුවේ රට තුළ සංචාරක කර්මාන්තය තුළ විශාල වර්ධනයක් සිදු වී තිබීම දැකගත හැකි වේ. මේ බව 2013 වසරේ දෙසැම්බර් මාසය වනවිට ලංකාවට පැමිණි මුළු විදේශිකයින් සංඛ්‍යාව වර්ධනය වීම මනාවටම තහවුරු කරගැනීමට හැකි වේ. සංචාරක කර්මාන්තය රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධාන කර්මාන්තය බවට පත් කරමින් සංචාරක කර්මාන්තයේ වර්ධනය වෙනුවෙන් විශාල ව්‍යාපෘති හා සැලසුම් ක්‍රියාත්මක කරන වත්මන් රජයේ නව බලාපොරොත්තුව වී තිබෙන්නේ 2016 වනවිට ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින් පිරිස ලක්ෂ 25ක් දක්වා වැඩි කිරීමටයි. මීට අමතරව දේශීය සංචරකයින්ගේ සංචාරක කටයුතු වර්ධනය කිරීමට ද නොයෙක් සැලසුම් නිර්මාණය කරමින් පවතී. නොයෙක් බාධා හමුවේ නොසැලී ඉදිරියටම පැමිණි ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය අද වනවිට එහි උපරිමයට ළඟාවෙමින් පවතින ආකාරය ඉහත කරුණු කාරණාවලින් මනාවට පසක් කරගැනීමට හැකිවේ.

## ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දේශීය ආර්ථික වර්ධනයට දක්වන දායකත්වය

ශ්‍රී ලංකාවේ පවත්නා රමණීය වෙරළ තීරය, වැව්, ගංගා, දියඇලි, කඳුකර ස්වභාවික දර්ශනයන්, වැසි වනාන්තර, පෞරාණික ශිෂ්ටාචාර නටඹුන් වැනි වටිනා ස්වභාවික සම්පත්වලින් ඒකරාශී වී පැවතීම නිසා සංචාරකයින්ගේ සිත් ඇදගන්නා තෝතැන්නක් බවට පත් වේ. එසේම වෙරළාශ්‍රිත නිවාඩු ගත කිරීමේ ජනප්‍රිය සංචාරක ආකාර්ශනයක් (Beach Holiday Attraction) ලෙස පවතින නමුදු, අව්‍යාජ සංස්කෘතිය, සොබා දහමේ අසමසම බව, ග්‍රාමීය ජීවන ක්‍රමය සහ මිත්‍රශීලි ජනතාව පදනම් කර ගත් විවිධ ආකාරයේ සංචාරක ක්‍රියාකාරකම් මේ තුළ ජනිත වීම නිසා සංචාරතයින්ගේ බහුල ලෙස ඇදී ඒමක් සිදු වේ. මේ අනුව කදිම සංචාරක තෝතැන්නක් බවට පත් වන ශ්‍රී ලංකාවේ ආකර්ශනය පිළිබඳ මාර්කෝ පෝලෝ මෙසේ අදහස් දක්වා ඇත. එනම්,

"අන්දමන් දූපත්වලින් පිටත්ව මදක් නිරිත දිගට සැතපුම් 1000 ක් යාත්‍රා කිරීමේදී නිසැකවම, සමස්ත ලෝකයේ එම ප්‍රමාණයේ ඉතාමත් අලංකාර දිවයින වන ශ්‍රී ලංකාවට දේශාටකයා ළඟා වෙනු ඇත" යනුවෙනි (සිල්වා,2011 පෙබර/මාර්තු).

සංචාරක ව්‍යාපාරය දේශිය ආර්ථිකයෙහි කැපීපෙනෙන සංධිස්ථානයක් වන අතර, එමඟින් සමාජීය, ආර්ථික, සංස්කෘතික සහ විවිධ පාරිසරික බලපෑම් ඇති වුවත් ආර්ථික සංවර්ධනයෙහි ලා සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන දායකත්වය අත්‍යාවශ්‍ය ආර්ථික ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය. මෙම ව්‍යාපාරයෙන් දේශිය ආර්ථිකය සංවර්ධනයෙහි ලා දායක වන ප්‍රධානම මුලය වශයෙන් විදේශ විනිමය ඉපයීම් දැක්විය හැකිය. එයට

අදාළ මෑත කාලීන වර්ෂයන්වල සංඛ්‍යා දත්ත පහත වගු සටහන් මඟින් පෙන්නුම් කර ඇත.

## විදේශ විනිමය ඉපයීම

සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතිනරටක වර්ධනය කර ගැනීමට රාජ්‍ය අංශය සුවිශේෂී කාර්යයභාර්යක් ඉටු කරනු ලබන්නේ මෙම ව්‍යාපාරය තුළින් මෙරට අයවැය හිඟය පියවා ගැනිමට අවශ්‍ය විදේශ විනිමය උපයා ගත හැකි ,විශාල අමුද්‍රව්‍ය යොදා ගැනිමකින් තොරව ක්‍රියාත්මක වන ව්‍යාපාරයක් නිසාවනි. සංචාරක ව්‍යාපාරය තුළින් උපයන විදේශ විනිමය වර්ධනය වන විට මෙරට ආර්ථිකයේ ද සංවර්ධනයක් වන බව පහත වගු සටහන තුළින් පෙනේ.

**වගු අංක 01: සංචාරක පැමිණීම් සහ විදේශ විනිමය ඉපයීම් (2004 - 2013)**

| වර්ෂය | සංචාරක පැමිණීම් | සංචාරක ලැබීම් |
|---|---|---|
| 2003 | 500,642 | 32,810.00 |
| 2004 | 566,202 | 42,666.3 |
| 2005 | 549,308 | 36,377.3 |
| 2006 | 559,603 | 42,585.5 |
| 2007 | 494,008 | 42,519.3 |
| 2008 | 438,475 | 37,094.0 |
| 2009 | 447,890 | 40,133.0 |
| 2010 | 654,476 | 65,018.0 |
| 2011 | 855,975 | 91,926.0 |
| 2012 | 1,005,605 | 132,427.0 |
| 2013 | 1,274,593 | 221,720.0 |

මූලාශ්‍රය :ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය , 2012

ඉහත වගු සටහනට අනුව 2012 වර්ෂයේදි සංචාරකයින්ගේ පැමිණීම් 1,005,605 ක් වු අතර එය 2013 දී 1,274,593 ක් ලෙස වර්ධනය වී ඇත. එම වර්ධනය වීමේ ප්‍රතිශතය 21% ක් වේ. මේ අයුරින් සංචාරකයින්ගේ පැමිණීම් වර්ධනය වන විට ඒ ආශ්‍රිතව මෙරට උපයනු ලබන විදේශ විනිමය ඉහළ අගයක් ගනී. එය සංඛ්‍යාත්මකව 2012 දී විදේශ විනිමය ඉපයීම් රුපියල් මිලියන 132,427 ක් උපයනු ලැබු අතර, 2013 දී එය රුපියල් මිලියන 221,720 ක් දක්වා වර්ධනය වී ඇත. එය ද 2012 වර්ෂයට

සාපේක්ෂව ප්‍රතිශතයක් වශයෙන් 40% ක වර්ධනීය තත්ත්වයකි. සමස්තයක් වශයෙන් ඉහත වගු සටහන පරිශීලනය කිරීමේදී ප්‍රත්‍යක්ෂ වන කරුණක් වන්නේ 2003 වසරේ සිට 2013 දක්වාම සංචාරක පැමිණීම් මෙන් ම විදේශ විනිමය ලැබීම් ද ඉහළ ගොස් ඇති බවයි. මෙයට හේතු ලෙස සඳහන් කළ හැක්කේ විශේෂයෙන් ම 2009 වසරේදී ත්‍රස්තවාදය ජයග්‍රහණය කිරීමෙන් පසු මෙරට ඇති වූ සාමකාමී වාතාවරණය නිසා මෙරටට පැමිණෙන සංචාරක ප්‍රමාණය වැඩි වී ඇති බවයි.

සංචාරක පැමිණීම් අඛන්ඩව ඉහළ යාම සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සංචාරක ඉපැයුම් ප්‍රමාණය 2012 වසරේදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,039 සමඟ සැසඳීමේදී 2013 වසරේදී එ.ජ.ඩොලර් මිලියන 1,715 ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අනුව 2012 වසරේදී එ.ජ.ඩොලර් 103 ක් ලෙස වාර්තා වූ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2013 වසරේදී එ.ජ.ඩොලර් 156.5 ක් දක්වා ඉහළ ගිය අතර සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන 2012 වසරේදී වාර්තා වූ දින 10 සිට 2013 වසරේදී දින 8.6 දක්වා පහළ ගියේය. තවද හෝටල් සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු වීම සහ ඉහළ ක්‍රයශක්තියක් සහිත සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යාම 2013 වසරේදී සංචාරක ඉපයුම් ඉහළ යාමට දායක විය.

මේ ආකාරයට විදේශ විනිමය ඉපයීම් සම්බන්ධව 2012 වර්ෂයේදී පස්වන ස්ථානයේ පසුවන අතර මෙමඟින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභය ආර්ථික සංවර්ධනයෙහි ලා මහත් පිටුවහලක් වේ. 2009 දී ත්‍රස්තවාදය අවසන් වීමත් සමඟම මෙරටට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණයේ භූමිකාව වර්ධනය වීම නිසා විදේශ විනිමය ඉපයීම ද වර්ධනය වී ඇත. 2012 වර්ෂය වන විට සංචාරක පැමිණීම 1,005,605 දක්වා වර්ධනය වී ඇති අතර විදේශ විනිමය ඉපයීම් ද 2011 ට සාපේක්ෂව 2012 වන විට 69% කින් වර්ධනය වී ඇත. එනම් 2011 වූ විදේශ විනිමය රුපියල් මිලියන 91,926 ක අගය 2012 වන විට රුපියල් මිලියන 132,427 කින් වර්ධනය වී ඇත. එසේම එක් දිනක සංචාරක ලැබීම් ඇමරිකන් ඩොලර් 5 කින් වර්ධනය වී ඇත. එක් දිනක සංචාරක ලැබීම් ප්‍රමාණය 2011 වර්ෂයේදී ඇමරිකන් ඩොලර් 98 සිට 2012 දක්වා වන විට ඇමරිකන් ඩොලර් 103 දක්වා වර්ධනය වී ඇත. මේ ආකාරයට සංචාරකයින්ගේ පැමිණීම 2009 න් පසුව මෑත කාලීනව ක්‍රමිකව වර්ධනය වීම නිසා සංචාරක විදේශ විනිමය ඉපයීම් ද ක්‍රමිකව වර්ධනය වන බව දක්නට ලැබේ.

**වගු අංක 02: විදේශ විනිමය ඉපයීමේ සංචාරක ව්‍යාපාරයේ සාපේක්ෂ වැදගත්කම**

| අංශය | 2011 විදේශ විනිමය ඉපයීම් රු.මිලියන | 2011 විදේශ විනිම ඉපයීම් % | අංශය | 2012 වීදේශ විනිමය ඉපයීම් රු.මිලි: | 2012 විදේශ විනිමය ඉපයීම් % |
|---|---|---|---|---|---|
| පෞද්ගලික විදේශ ප්‍රේෂණ | 569,103 | 26.7% | පෞද්ගලික විදේශ ප්‍රේෂණ | 763,980 | 30.1% |
| රෙදිපිළි හා ඇඟලුම් | 463,509 | 21.7% | රෙදිපිළි හා ඇඟලුම් | 508,607 | 20.0% |
| තේ | 164,869 | 7.7% | ප්‍රවාහන සේවා | 208,620 | 8.2% |
| ප්‍රවාහන සේවා | 153,826 | 7.2% | තේ | 180,429 | 7.1% |
| රබර් පදනම් කරගත් නිෂ්පාදන | 97,831 | 4.6% | සංචාරක ව්‍යාපාරය | 132,427 | 5.2% |
| සංචාරක ව්‍යාපාරය | 91,926 | 4.3% | රබර් පදනම් කරගත් නිෂ්පාදන | 109,458 | 4.3% |

මුලාශ්‍රය :ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය , 2012

සංවර්ධිත රටවල සංචාරකයින් විශාල ප්‍රමාණයක් දේශිය වශයෙන් ආකර්ෂණය වීම නිසා සංවර්ධිත රටවලින් ද විදේශ විනිමය බහුල ලෙස උපයාගත හැකි වී ඇත. එම නිසා දේශිය ආර්ථිකය සංවර්ධනය කිරිම සඳහා සංචාරක ව්‍යාපාරය වඩා වැදගත් වේ. එසේම මෙම විදේශ විනිමය ඉපයීම නාගරික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ව්‍යාප්තවීමක් දක්නට ලැබේ. එනම් බහුල වශයෙන් පැමිණෙන සංචාරකයින් නිසා නාගරිකව හෝටල්, සංවර්ධන නිකේතන, ආශ්‍රිතව සංචාරක ඉපයීම් වර්ධනය වුවද ග්‍රාමීය ප්‍රදේශවල ද ස්වභාවික හා ආගමික ස්ථාන කරා සංචාරක පැමිණීම වර්ධනය වන නිසා කුඩා හා හස්ත කර්මාන්ත, ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම සම්බන්ධව ද සංචාරක ඉපයීම් ලබා ගත හැකිය. මෑත කාලීනව සංචාරක ව්‍යාපාරය තුළින් වර්ධනය වන විදේශ විනිමය ඉපයීම් පහත වගුව අනුව හඳුනාගත හැකිය.

**වගු අංක 03: විදේශ විනිමය ඉපයීම් (2011 - 2012)**

| අංශය | රු.මිලියන | | | ඇ.ඩො.මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | % වෙනස | 2011 | 2012 | % වෙනස |
| බැංකු | 10,360.5 | 14,877.9 | 43.6 | 94.5 | 116.7 | 23.4 |
| සංචාරක සේවා සපයන ආයතනය | 8,273.8 | 12,415.2 | 50.0 | 75.5 | 97.4 | 29.0 |
| කඩසාප්පු | 10,111.8 | 15,210.6 | 50.4 | 92.3 | 119.3 | 29.2 |
| හෝටල් | 59,751.4 | 84,918.6 | 42.1 | 545.3 | 665.6 | 22.0 |
| මැණික් කර්මාන්තය | 3,428.5 | 5,004.7 | 45.9 | 31.3 | 39.3 | 25.6 |
| එකතුව | 91,926.0 | 132,427.0 | 44.1 | 838.9 | 1,038.30 | 23.8 |

මූලාශ්‍රය :ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වාර්ෂික වාර්තාව, 2012

ඉහත වගු අංක 03 ට අනුව, 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ විදේශ විනිමය ඉපයීමේ වැඩිම දායකත්වයක් සපයා ඇති අංශය වන්නේ කඩසාප්පු ය. එහි අගය රුපියල් මිලියන වලින් 50.4% ක ප්‍රතිශතයක් වන අතර, ඇ.ඩො.මිලියන වලින් 29.2% ක් වෙයි. දෙවන වැඩිම විදේශ විනිමය උපයන අංශය සංචාරක සේවා සපයන ආයතනය වන අතර, එහි අගය රුපියල් මිලියන වචින් 50% ක් ද, ඇ.ඩො.මිලියන වලින් 29% ක් වී ඇත. සෙසු අංශයන් වන බැංකු, හෝටල්, මැණික් කර්මාන්තය යන අංශයන්ගේ විදේශ විනිමය ඉපයීම් දායකත්වය ද මෙයට ඇතුළත් වේ. මේ ආකාරයට විදේශ විනිමය ඉපයීම් වර්ධනය වීම රඳා පවතිනුයේ මෙරටට පැමිණෙන සංචාරක ප්‍රමාණය මතය.

**සාරාංශය**

සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය මත දැඩි බලපෑමක් එල්ල කරන බව පැහැදිලිය. මේ තුළ විදේශ විනිමය ඉපයීම් වලට ප්‍රධාන තැනක් හිමි වේ. මේ ආකාරයේ ක්‍රමිකව වර්ධනය වන සංචාරක පැමිණීම් නිසා විදේශ විනිමය ඉපයීම් ද වර්ධනය වී ඇති ආකාරය ඉහත සංඛ්‍යා දත්ත තුළින් පැහැදිලි වේ. මෙම තත්ත්වය රටක ආර්ථික සංවර්ධනයෙහි ලා ධනාත්මකව බලපානු ලබයි. නමුත් මෙම වෘද්ධිය අඛණ්ඩ වර්ධනයක් නොවේ. එය රටේ අනෙකුත් අංශ මඟින් එල්ලවන බලපෑම

මත උත්පාත හා අවපාත වලට ලක් වෙමින් දැඩි විචලනයකට ලක් විය හැකිය. සංචාරක ව්‍යාපාරයේ හොඳ හෝ නරක අප විසින් තුලනාත්මකව සලකා බැලීමේදි අප වඩාත් සැලකිල්ලක් දැක්විය යුතු වන්නේ ශ්‍රී ලංකාවේ දැනට පවතින ආර්ථික අර්බුදයට සංචාරක ව්‍යාපාරය හැරුණු විට වෙනත් විකල්ප කර්මාන්තයකින් පිටුවහලක් ලබා ගත හැකිද යන්න පිළිබඳවයි. දැනට ශ්‍රී ලංකාවේ අනෙකුත් විදේශ විනිමය උපයා දෙන කර්මාන්ත වන ඇඟළුම්, විදේශ රැකියා හා තේ කර්මාන්තවල අනාගත ස්ථාවරභාවය ද අවිනිශ්චිතය. නමුත් සෑම කර්මාන්තයක්ම තුලනාත්මකව සමාලෝචනය කිරිමේදි පැහැදිලි වන කරුණක් වන්නේ යම් පිරිවැයක් නොමැති කර්මාන්තයක් ලොව නොමැති තරම් බවය. සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ද එය එසේමය. සෑම විටම අප සංවර්ධනය යැයි විස්තර කරන සෑම සංවර්ධනයකම පිරිවැයක් ද අඩංගු වී පවතී. මේ නිසා යම්කිසි පිරිවැයකින් තොරව සංවර්ධනයට ළඟා විය හැකි ක්‍රමානුකුල සැලසුම්කරණ තුළින් පිරිවැය හා ගැටලු අවම කර ගත යුතු වේ. ගැටලු අවම කර ගැනීමටත්, ප්‍රතිලාභ උපරිම කිරිමටත් ජාතික වශයෙන් කරනු ලබන සැලසුම් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට ද පොදු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කුමාර, එච්.එස්.එන්. (2009). *ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ තොරතුරු අවශ්‍යතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්*, (ශාස්ත්‍රවේදි උපාධි නිබන්ධනය), දළුගම: කැලණිය විශ්ව විද්‍යාලය (අප්‍රකාශිතයි).

කුමාරි, පී.පී.ඩී.එන්. (2012). (5), ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දේශිය ආර්ථික වර්ධනය කෙරෙහි දක්වන දායකත්වය පිළිබඳ විමසීමක්, *සන්තති 2012*, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, දළුගම: කැලණිය විශ්ව විද්‍යාලය.

ගුණවර්ධන.පී., හා සල්ඩින්.එම්. (2008). *සංචාරක කර්මාන්තය :දියුණු වෙමින් පවතින රටවල් සහ සංචාරක නිෂ්පාදන*, ජා-ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

මුදල් හා ක්‍රම සමපාදන අමාත්‍යංශය, (2006). මහින්ද චින්තනයඃ *නව ශ්‍රී ලංකාවක් කරා 2006-2016.* ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, කොළඹ සංඛ්‍යා අත්පොත, (2010). කොළඹ: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

පතිරණ, යු.පී.එස්. (2010). *සංචාරක ව්‍යාපාරය පසුබිම, බලපෑම, හා නව ප්‍රවණතා*, දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශකයෝ.

වාර්ෂික වාර්තා, කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. (2012). *සංචාරක ව්‍යාපාරය වාර්ෂික වාර්තාව*, කොළඹ : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

සිල්වා, ඩී.ඒ.සී.එස්. (2011 පෙබර/මාර්තු). සංචාරක ව්‍යාපාරයේ සේවා නියුක්තිය පිළිබඳ නූතන ප්‍රවණතාවන් හා රටාවන් සහ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය උදෙසා මානව සම්පත් සංවර්ධනය සඳහා පවත්නා අභියෝගයන්, *ආර්ථික විමසුම*, කොළඹ : මහජන බැංකුව.

Ceylon Tourist Board, *Annual Statistical Report*.